**සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ ගනුදෙනු පිළිබඳ වාර්තාව - 2020, 2021, 2022**

---

සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනමේ 2020, 2021, 2022 වර්ෂ සඳහා වූ මෙහෙයුම් කටයුතු පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම් පනතේ 11 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන 2020, 2021 හා 2022 වර්ෂ සඳහා පදනමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ පමණක් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 මූල්‍ය ප්‍රකාශන විගණනය සඳහා ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම් පනතේ 11 වගන්තිය ප්‍රකාරව දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන සෑම වර්ෂයක් සඳහා වන පදනමේ මූල්‍ය ප්‍රකාශන ඉන් පසුව එළඹෙන පෙබරවාරි මාසයේ අවසාන දිනයට පසු නොවන දිනයකදී විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කල යුතු වුවද, 2020,2021,2022 වර්ෂයන් සඳහා වන මූල්‍ය ප්‍රකාශන මෙම වාර්තාවේ දිනය වනවිටත් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2020 හා 2021වසරවලට අදාල මූල්‍ය ප්‍රකාශන සකසා ඇති අතර කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අනුමැතිය ලබා ගැනීමෙන් පසුව හැකි ඉක්මනින් ලබා දීමට කටයුතු කරන බව. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනයට ඉදිරිපත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(2)(ඇ) ඡේදය | ලබාගත් අතුරු අග්‍රිමයන් අදාල කාර්යය නිම කල විගසම පියවිය යුතු වුවද, 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුල ලබාදෙන ලද එකතුව රු.1,004,938 ක්වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. | මීට අදාල නිලධාරීන් හට සේවක භාරකාර අරමුදල් සහ පාරිතෝෂිත දීමනා ලබා දී නොමැති බැවින් ඔවුන්ගේ පාරිතෝෂිත දීමනාවෙන් අයකර ගැනීමට කටයුතු කරන බව. | ලබා දෙන ලද අත්තිකාරම් මුදල් රෙගුලාසිවලට අනුකූලව පියවා ගැනීමට අවශ්‍ය කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදය (i) 2.1 ඡේදය | පදනම සඳහා බඳවාගැනීමේ පටිපාටියක් සකස් කර ගැනීම වෙනුවෙන් 2013 වර්ෂයේදී බාහිර උපදේශකවරයෙකු වෙත රු. 150,000 ක මුදලක් ගෙවා තිබුණද බඳවාගැනීමේ පරිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | බඳවාගැනීමේ පටිපාටි සකස් කර 2023 දෙසැම්බර් 07 දින කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇති බව. | බඳවාගැනීමේ පරිපාටිය අනුමත කරවා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | (ii) 4.2.1 ඡේදය | පදනම සඳහා මාර්ගෝපදේශ සකස් කරන තෙක් ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කරන බවට කළමනාකරණ මණ්ඩලය තීරණයක් ගෙන තිබියදී 2021 වර්ෂයේදී පදනමේ ගණකාධිකාරී තනතුර සඳහා ප්‍රධාන විධායක නිලධාරී විසින් නිලධාරියෙකු පත්කිරීම සිදුකර තිබුණි. | පදනමේ ගණකාධිකාරී තනතුර සඳහා ප්‍රධාන විධායක නිලධාරී විසින් පත්වීම් ලබාදී තිබුණේ අප ආයතනය කළමනාකරණ මණ්ඩලයක් මඟින් පාලනය වන බැවිනි. නැවත මාණ්ඩලික තනතුරු සඳහා බඳවා ගැනීමේදී අමාත්‍යාංශ ලේකම් හරහා සිදු කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| | (iii) 5.2.6 ඡේදය | පදනමේ ගණකාධිකාරී තනතුර සඳහා බඳවා ගැනීමට පත් කරන ලද තේරීම් මණ්ඩලය ආයතන සංග්‍රහයේ විධිවිධාන වලට පටහැනිව පදනමේ නිලධාරීන් 03 දෙනෙකු සාමාජිකයින් ලෙස පත්කර තිබූ අතර එම නිලධාරීන් පත්කිරීමට අදාළ ලිපියක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | මෙය එවකට සිටි පදනමේ නිලධාරීන් අතින් සිදු වූ වැරදීමක් වන අතර මින් ඉදිරියට මෙවැනි වැරදි සිදු නොවීමට වග බලා ගන්නා බවත් ඉදිරියේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණවලදී නිවැරදි ක්‍රියාමාර්ගය අනුගමනය කරන බව. | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කල යුතුය. |
| (ඇ) | 2005 අංක 19 දරන සෞම්‍යමූර්ති තොණ්ඩමන් අනුස්මරණ පදනම පනතේ 5 සහ 6 වගන්ති | පදනමේ අරමුණු ක්‍රියාවට නැංවීමේදීද බලතල, කාර්ය හා කර්තව්‍යයන් ඉටුකිරීමේදීද අවශ්‍ය විය හැකි තීරණ ගැනීම සහ සමාලෝචනයන් සිදු කිරීම සඳහා පදනමේ කළමනාකරණ මණ්ඩලය 2021 හා 2022 වර්ෂයන්වලදී රැස්වී නොතිබුණි. | 2021 වර්ෂයේ පැවති කොරෝනා වසංගතය හේතුවෙන් කළමනාකරණ මණ්ඩල රැස්වීම් පැවැත්වීමටත් සාමාන්‍ය පරිදි කාර්යාල පවත්වා ගැනීමටත් නොහැකි තත්ත්වයක් උදා වූ බව. | කළමනාකරණ මණ්ඩල රැස්වීම් Zoom තාක්ෂණය ඔස්සේ හෝ පවත්වා ආයතන අභිවෘද්ධියට අවශ්‍ය තීරණ කඩිනමින් ගත යුතුය. |
| (ඈ) | 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය<br>(i) 4.2 ඡේදය | 2020,2021,2022 වර්ෂ සඳහා ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීමකින් තොරව රු.71,216,514ක වටිනාකමැති ප්‍රාග්ධන වියදම් සිදුකර තිබුණි. | 2020,2021,2022 වර්ෂ සඳහා ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන ලබා දී නොමැති හෙයින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොමැති බව. | අමාත්‍යාංශයේ ප්‍රතිපාදන මඟින් පදනමේ ප්‍රාග්ධන වියදම් දරන බැවින් වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කල යුතුය. |
| | (ii) 1.2.1(ඇ), 2.5.1(ආ), (ඇ), (ඈ), | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව වටිනාකම | මෙම උපකරණ කට්ටල මිලදී ගනු | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ |

| | | | | |
|---|---|---|---|---|
| | 2.6.1(අ) (i), (ii), (iv), 2.11.3(අ), 2.14.1, 4.2.2, 4.3.1, 5.1.1(අ), (ආ), 5.3.3, 5.3.10, 6.2.1(ඇ), 8.9.1(ආ), 8.12.3 වගන්ති | රු.7,888,800 ක් වූ උපකරණ කට්ටල 180ක් 2021 වර්ෂයේදී තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව සම්පූර්ණ කරන ලද සිසුන් වෙත බෙදා හැරීම සඳහා මිලදී ගෙන තිබුණි. | ලැබුවේ 2021 වර්ෂයේදී වන අතර මෙම උපකරණ මිලදී ගන්නා අවස්ථාවේ රටේ පැවති වාතාවරණය හා ප්‍රවාහන දුෂ්කරතා පැවතීමත් භාණ්ඩවල හිඟතාවයත් නිසා ප්‍රායෝගිකව ප්‍රසම්පාදන කාල සටහන් සකස් කිරීමට නොහැකි විය. මෙම ප්‍රසම්පාදනය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුව අමාත්‍යාංශ ලේකම් විසින් පත්කර ඇති අතර ප්‍රසම්පාදන කමිටුවේ නිර්දේශය සඳහා අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියද ලබාදී ඇති බව. | වලට අනුකූලව මිලදී ගැනීම් සිදුකල යුතුය. |
| | (iii) 1.2.1(ඇ), 4.2.2 (අ),(ආ),5.4.8(අ), (ආ), 6.3.3 (ආ), 8.7.1 (ආ) වගන්ති | ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට පටහැනිව වටිනාකම රු.1,519,486 ක් වියදම් දරා අවන්හලක් ඉදිකර තිබුණි. | 2021 වර්ෂයේ රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් වතුකරයේ අඩු ආදායම්ලාභී පවුල් වලට ස්වයං රැකියා ලබාදීමේ අරමුණින් එම කාල වකවානුව තුල ප්‍රවාහනය සහ භාණ්ඩ සපයා ගැනීමේ පැවති දුෂ්කරතාවය නිසා ප්‍රායෝගිකව කල හැකි ආකාරයට ප්‍රසම්පාදන කටයුතු සිදුකලද ප්‍රසම්පාදන මාර්ගෝපදේශයට පටහැනි ලෙස කටයුතු කර නොමැති බවත් ඉදිරියේදී එවැනි දෙයක් සිදු නොවන ලෙස කටයුතු කරන බව. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුකූලව ඉදිකිරීම් කටයුතු සිදුකළ යුතුය. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/ 12 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 6.5.1 | 2020, 2021 හා 2022 වර්ෂ සඳහා කෙටුම්පත් වාර්ෂික වාර්තාව විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | 2020 වර්ෂය සඳහා විගණකාධිපති වාර්තාව ලැබුණු විගස අදාල වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ | කෙටුම්පත් වාර්ෂික වාර්තාව පිළියෙල කර විගණකාධිපති |

| | | | | |
|---|---|---|---|---|
| | ඡේදය | | සහාගත කිරීමට කටයුතු කරන බව. | වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඊ) | 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/ 2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | 2020, 2021 හා 2022 වර්ෂ සඳහා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමට කටයුතු කර නොතිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර ඇති බව. | අමාත්‍යාංශ ලේකම් විසින් නිසි පරිදි අනුමත කරන ලද වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ඉදිරිපත් කල යුතුය. |
| (උ) | 2020 ඔක්තෝබර් 26 දිනැති අංක 02/ 2020 දරන කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු චක්‍රලේඛය | චක්‍රලේඛයේ සඳහන් විධිවිධානයන්ට පටහැනිව, සේවකයින් 56දෙනකු කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන 2021 මාර්තු සිට දෙසැම්බර් දක්වා කාල පරිච්ඡේදය සඳහා වැටුප් ලෙස එකතුව රු.22,532,331 ක් ද 2022 වර්ෂය සඳහා රු.29,037,151 ක්ද ගෙවා තිබුණි.<br>චක්‍රලේඛයේ 2(viii) වගන්තියට අනුව ප්‍රාථමික සේවා ගණයේ තනතුරු 31ක් සඳහා අවශ්‍ය සේවක පිරිස බහුකාර්ය සංවර්ධන කාර්යසාධන බලකා දෙපාර්තමේන්තුව මඟින් ලබා ගැනීමටද කටයුතු කර නොතිබුණි. | 2020 පෙබරවාරි මස සෞම්‍යමූර්ති තොන්ඩමන් අනුස්මරණ පදනම යලි ස්ථාපිත කිරීමෙන් පසු ආයතනයේ රාජකාරී කටයුතු සිදු කිරීමේ අවශ්‍යතාවය මත එවකට සිටි ගරු ඇමතිතුමාගේ උපදෙස් මත මෙම නිලධාරීන් බඳවාගෙන ඇති බව. | සේවක බඳවාගැනීම් සිදු කිරීමේදී චක්‍රලෙඛ විධිවිධාන අනුගමනය කල යුතුය. |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2022 දෙසැම්බර් 31 දිනට උපචිත වියදම් වටිනාකම එකතුව රු.10,415,894ක් විය. ඉන් රු.2,990,646 ක් වර්ෂ 03 ත් වර්ෂ 07 ත් අතර කාලපරිච්ඡේදයකට අදාළ හා රු.7,425,248 ක් වර්ෂ 07ක් ඉක්මවා තිබුණි. | ගෙවියයුතු ගිණුම් නිරවුල් කිරීමට හෝ අදාල ක්‍රියාමාර්ග ගැනීමට වාර්තාවක් සකස් කර ඇති අතර එය කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | උපචිත වියදම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |
| (ආ) | 2022 දෙසැම්බර් 31 දිනට රු.88,082,234 ක ගෙවිය යුතු ණයහිමි ශේෂ පැවති අතර වසර 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ණයහිමි ශේෂය රු.83,991,218 ක් විය. එම ශේෂය තුල 2014 සහ 2015 වර්ෂවලදී රාජ්‍ය සංස්ථාවකින් සිදුකල මිලදීගැනීම් වෙනුවෙන් රු.72,240,700ක මුදලක් ගෙවිය යුතුව | මෙම ශේෂ සනාථ කිරීම සඳහා කිහිප වතාවක්ම ලිපි යවා ඇතත් බහුතරයක් ලිපි මෙම ආයතන වසා ඇති බව සඳහන් කරමින් නැවත අප වෙත ලැබී ඇත. මෙම ණයහිමියන් පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් කළමනාකරණ මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලබන බව. | ගෙවිය යුතු ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කල යුතුය. |

පැවතුණි. එම ශේෂය නිරවුල් කිරීම සඳහා 2020 දෙසැම්බර් 01 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයක් මගින් අවශ්‍ය අයවැය ප්‍රතිපාදන මහා භාණ්ඩාගාරයෙන් සලසාගෙන හිඟ මුදල් පියවීමට කඩිනම් පියවර ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් එම නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රම්බොඩ තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා 2010 වර්ෂයේදී සචලීකරණ අත්තිකාරම් වශයෙන් ලබාදී තිබූ රු.7,544,265 ක් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම මෙම මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සඳහා 2013 වර්ෂය වන විට රු.25,678,995 ක් වැය කර තිබුණද අදාල නිම කිරීම් සම්පූර්ණ කර නොතිබීම හේතුවෙන් විගණන දිනය වූ 2023 ඔක්තොම්බර් 31 දක්වාම ඵලදායී ලෙස උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි. | සමහර සම්පත් පවත්නා ද්‍රවශීලතාවය මෙන්ම ප්‍රතිපාදන නිසි වේලාවට නොලැබීම මත කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස භාවිතා කිරීමට නොහැකි වී ඇති අවස්ථාද පවතින බව. | සම්පත් සකසුරුවම් ලෙස කාර්යක්ෂමව හා ඵලදායීව භාවිතා කල යුතුය. |

### 3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2011 අප්‍රේල් සිට 2013 අප්‍රේල් දක්වා කාලය තුලදී ක්ෂේත්‍ර සම්බන්ධීකරණ දීමනා ගෙවීම සඳහා පදනම විසින් ලබාදෙන ලද මුදල් අවභාවිතා කිරීමට අදාල 2013 ජූලි 24 දිනැති මූලික විමර්ෂණ වාර්තාව අනුව අදාල සේවකයින් දෙදෙනාගෙන් තව දුරටත් අයවියයුතු රු.3,202,500 ක මුදල අයකර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග 2023 දෙසැම්බර් 31 දින වන විටත් ගෙන නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුව මගින් උපදෙස් ලබා නොදීම හේතුවෙන් නුවරඑළිය වංචා විමර්ශන කාර්යාංශය විසින් ඒ සඳහා අදාල ඉදිරි නීතිමය කටයුතු සිදුකර නොමැති බව. | මෙම මුදල අයකර ගැනීමට අදාල කටයුතු කඩිනම් කල යුතුය. |
| (ආ) | සෞම්‍යමූර්ති තොණ්ඩමන් පදනම යටතේ පවත්වාගෙන යනු ලබන තොණ්ඩමන් පුහුණු මධ්‍යස්ථානයේ පාඨමාලාවන් 07ක් සඳහා 2018සිට 2022දක්වා කාලයට අදාලව බඳවාගැනීමට අපේක්ෂිතව පැවති සිසුන් සංඛ්‍යාව 130බැගින් වූ අතර සිසුන් ආකර්ෂණය කරගැනීමේ ක්‍රමවත් වැඩ පිළිවෙලක් නොමැතිවීම හේතුවෙන් 2022 වර්ෂයේදී බඳවාගත් සිසුන් ප්‍රමාණය | සිසුන් ලියාපදිංචියේදී සුදුසු නොවන සිසුන් බඳවාගෙන නොමැති බවත් කොවිඩ් වසංගතය හේතුවෙන් ප්‍රායෝගික පරීක්ෂණ නිසි කලට නොපැවැත්වීම හා ආර්ථික අර්බුද තත්ත්වය මත සිසුන් පංතිවලට සහභාගී වීම ඉතාමත් අඩු මට්ටමක පැවතීම නිසා විධිමත් පරිදි විෂය ධාරා | බඳවා ගැනීම් නිසි පරිදි සිදුකර විභාග පවත්වා නියමිත කාලයේදී ප්‍රතිඵල නිකුත් කල යුතු අතර විභාග සමත් වීමද යම් ඵලදායි මට්ටමක පවත්වා ගත යුතුය. පාඨමාලා හැරයාම් |

| | | | |
|---|---|---|---|
| | පිළිවෙලින් 79, 68, 87, 65 ක් වූ අතර එය බඳවාගැනීමට අපේක්ෂිත සිසුන් සංඛ්‍යාවට අනුරූපව ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 61, සියයට 52, සියයට 67ක් සහ සියයට 50ක් වැනි අඩු මට්ටමක පැවතුණි.<br>2020 වර්ෂයේ පාඨමාලා 03ක සහ 2021 සහ 2022 වර්ෂයන්ට අදාලව පාඨමාලා 08ක විභාග පැවැත්වීමට 2023 සැප්තැම්බර් වන විටත් කටයුතු කර නොතිබුණි .පාඨමාලා හැදෑරීම සඳහා 2022 වර්ෂයේ බඳවාගෙන තිබූ සිසුන් 366 දෙනෙකුගෙන් සිසුන් 260 ක් විභාග සමත්වීම හෝ පාඨමාලා සම්පූර්ණ කිරීම සිදුකර තිබූ අතර එය බඳවාගත් සිසුන් ප්‍රමාණයට අනුරූපව සියයට 71ක ප්‍රතිශතයක් විය. 2022වර්ෂය අවසානය වන විට පවත්වනු ලැබූ පාඨමාලා 14ක් සඳහා බඳවාගත් සිසුන් 296 න් 102ක් පාඨමාලා අතහැර ගොස් තිබුණි. එය එක් එක් පාඨමාලා ලෙස ගත් විට සියයට 18 සිට 57 දක්වා පරාසයක පැවතුණි. | හැදෑරීම එම කාල සීමාව තුල නොහැකිවීම නිසා විභාග සමත්වීම අවම වීමක් සිදුවී ඇති බව. | අවම කර ගැනීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | විවිධ කාර්යයන් ඉටු කර ගැනීම සඳහා පෞද්ගලික ආයතනවලට ගෙවන ලද අත්තිකාරම්, ස්වයං රැකියා ව්‍යාපාර සඳහා බාහිර පාර්ශවයන්ට ලබා දී තිබූ ණය, කාර්ය මණ්ඩලය වෙත ලබාදී තිබූ ණය, ලංකා කම්කරු කොංග්‍රසයෙන් අයවිය යුතු මුදල් ලෙස 2008 වර්ෂයේ සිට පැවත එන එකතුව රු.16,337,893ක් වූ ලැබිය යුතු ශේෂ 2023 දෙසැම්බර් 31 දක්වාම අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | මෙම අයකරගැනීම් සඳහා ලිපි යොමුකර ඇතත් ගෙවා නොමැති අතර ඒ සඳහා අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කරනු ලබන බව. | අයකරගැනීම් සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඈ) | තොණ්ඩමන් ක්‍රීඩා සංකීර්ණය, තොණ්ඩමන් සංස්කෘතික මධ්‍යස්ථානය සහ තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය පිහිටි ඉඩම්වල අයිතිය පදනම නමට පවරා ගැනීමටද එක් එක් ඉඩමෙහි අගය තක්සේරු කර වටිනාකම් වෙන් වෙන් වශයෙන් හඳුනා ගැනීමටද කටයුතු කර නොතිබුණි. ප්‍රජාශක්ති මධ්‍යස්ථාන 35 ක් ඉදිකිරීම සඳහා 2012 වර්ෂයේදී ඉඩම් මැනුම් කටයුතු සිදුකිරීම වෙනුවෙන් රු.2,359,298 ක් වැය කර තිබුණද, එම ඉඩම් පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉඩම් අයිතිය පවරා ගැනීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පවතින බවත්, ප්‍රජා ශක්ති මධ්‍යස්ථාන 35 ඉදිකිරීමට මැනුම් කටයුතු අවසන් කර තිබුණද ප්‍රතිපාදන වෙන් කොට නොමැති බැවින් ඉදිකිරීම් අවසන් කර නොමැති බව. | ඉඩම් අයිතිය පවරා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (ඉ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 4.2.2 වගන්තියේ සඳහන් පරිදි සෑම මසකම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වලදී ආයතනයේ පැවැත්මට වැදගත්වන කරුණු පිළිබඳව සාකච්ඡා කල යුතු බව දක්වා තිබුණද සෞම්‍යමූර්ති | එවකට සිටි ගරු අමාත්‍යතුමා අභාවප්‍රාප්ත වීම හේතුවෙන් කළමනාකරණ මණ්ඩල රැස්වීම් කල් දැමීමට සිදු වූ බව. | කළමනාකරණ මණ්ඩල රැස්වීම් නිසි පරිදි පවත්වා ආයතනයේ අභිවෘද්ධියට අවශ්‍ය තීරණ කඩිනමින් ගත |

| | | | |
|---|---|---|---|
| | තොණ්ඩමන් අනුස්මරණ පදනමේ කළමනාකරණ මණ්ඩලය 2020 වර්ෂයේදී දින 02ක් පමණක් රැස්වී තිබුණි. මේ හේතුවෙන් පදනමේ අරමුණු හා ප්‍රතිපත්තිමය තීරණ සාක්ෂාත් කර ගැනීම සඳහා පදනම මෙහෙයවීමට නොහැකි වී තිබුණි. | | යුතුය. |
| (ඊ) | ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය යටතේ ප්‍රජාශක්ති මධ්‍යස්ථානවලට ලබාදීම සඳහා 2014 දෙසැම්බර් 01 දින මිලදී ගෙන තිබුණු රු.736,000 ක් වටිනා සිමෙන්ති බ්ලොක් ගල් මැෂින් 8 ක් ස්වයං රැකියාලාභීන් වෙත බෙදා දීමකින් තොරව 2023 වර්ෂය වන විටත් නිෂ්ක්‍රියව පැවතුණි. | 2024 වර්ෂයේ මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට සැලසුම් කරමින් සිටින බව. | කඩිනමින් ව්‍යාපෘති ආරම්භ කර ඌන උපයෝජිත වත්කම් භාවිතයට ගැනීම සිදු කල යුතුය. |
| (උ) | ඩයගම හා වටගොඩ ප්‍රජාශක්ති මධ්‍යස්ථානවල එක් ව්‍යාපෘතියක ඇස්තමේන්තු වටිනාකම රු.9,536,283ක් වූ කුකුළු පාලනය, එළු පාලනය හා බිම්මල් වගාව සහ පොලිතීන් ගෘහ ආශ්‍රිත වගා ව්‍යාපෘති 02ක් වෙනුවෙන් 2020 වර්ෂයේදී රු.3,687,620 ක් වැය කර අරඹා තිබුණි. මෙම ව්‍යාපෘති 02 ම අත්හැර දමා තිබීම හේතුවෙන් 2023 ඔක්තෝබර් වන විට දරන ලද රු.10,001,629 ක මුළු මුදලම නිෂ්කාර්ය වියදමක් වී තිබුණි. | මෙම ව්‍යාපෘති 02 සම්පූර්ණයෙන් අත්හැර දමා නොමැති අතර වැඩ නතර කිරීමට සිදු වූයේ 2021 හා 2022 වර්ෂවල රටතුල පැවති අයහපත් වාතාවරණය නිසාවෙනි. කෙසේ වෙතත් ඩයගම ව්‍යාපෘතිය පෞද්ගලික ආයතනයක් සමඟ ඒකාබද්ධ කිරීම සඳහා දැනටමත් සාකච්ඡා පවත්වා ඇති අතර මෙම වසරේ පළමු කාර්තුව තුලදී එය සාර්ථක කර ගැනීමට කටයුතු සැලසුම් කර ඇති බව. | අරමුණු රැසක් ඉටුකර ගැනීම සඳහා ආරම්භ කල මෙම ව්‍යාපෘති වෙනුවෙන් දරන ලද අරමුදල් නිෂ්කාර්ය වියදම් බවට පත් වීමට ඉඩ නොදිය යුතුය. |
| (ඌ) | කොන්ත්‍රාත් වටිනාකම රු.3,443,884 ක් වූ "සාලෙ ඕරම්" නමින් අවන්හලක් ඉදිකිරීම සඳහා 2021 වර්ෂයේදී රු.1,519,486 ක් කොන්ත්‍රාත්කරුවෙකු වෙත ගෙවා තිබුණි.<br>මෙම ව්‍යාපෘතිය ඉදිරියට කරගෙන යාම සඳහා ඉඩම අයත් විදුලිබල මණ්ඩලයේ අනුමැතිය විගණිත දින වන 2023 නොවැම්බර් 15 දින වන විටත් ලැබී නොමැති බැවින් ඉදිකිරීම් වෙනුවෙන් දරා ඇති රු.1,519,486 ක වියදම නිෂ්කාර්ය වියදමක් බවට පත්වී තිබුණි. | මෙම ඉදිකිරීම සඳහා දරා ඇති වියදම නිෂ්කාර්ය වියදමක් නොවන බවත් එය මෙම ව්‍යාපෘතිය සඳහා යොදා නොගතහොත් වෙනත් කාර්යයන් රැසක් සඳහා ඉදිකර ඇති ගොඩනැගිල්ල භාවිතා කලහැකිය. අදාල ප්‍රාදේශීය ලේකම් විසින් 2021 සැප්තැම්බර් 27 දින ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබාදී ඇත. එසේ තිබියදී ඉහළ කොත්මලේ ජල විදුලි ව්‍යාපෘතියේ එකඟතාවයක් ගැනීමට අවශ්‍ය නොවන බව. | දරා ඇති වියදමට සාපේක්ෂව ඉදිකර ඇති අදාල ගොඩනැගිල්ල ඵලදායීව ප්‍රයෝජනයට ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |
| (එ) | වටිනාකම රු.7,888.800 ක් වූ 2020 සහ 2021 වර්ෂවල පුහුණුව සම්පූර්ණ කරන ලද පාඨමාලා 05කට අදාල සිසුන් වෙත බෙදා හරින ලද උපකරණ කට්ටල 99 කින් 69 ක් බාහිර පුද්ගලයින්හට බෙදා දී තිබූ අතර පාඨමාලා සඳහා සිසුන් බඳවාගැනීමේ වයස් සීමාව අවුරුදු 16 ත් අවුරුදු 25 ත් අතර වුවද | මෙම උපකරණ කට්ටල මිලදී ගනු ලැබුයේ තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානයේ පුහුණුව ලැබූ ළමුන් සඳහා වුවත් මෙම ව්‍යාපෘති යෝජනාව සකස් කරන අවස්ථාව වන විට මෙම උපකරණ ලබා ගැනීම හා ස්වයං රැකියා | ව්‍යාපෘති ආරම්භ කිරීමේදී නිසි ශක්‍යතා අධ්‍යයනයක් කර අවශ්‍යතාවය නිසි පරිදි හඳුනාගෙන නියමිත පරිදි භාණ්ඩ මිලදීගෙන |

| | | |
|---|---|---|
| උපකරණ කට්ටල බෙදාදෙන ලද බාහිර පුද්ගලයින් 69 දෙනාගෙන් 30 දෙනෙකුගේ වයස් සීමාවන් අවුරුදු 36 සිට අවුරුදු 51දක්වා පරාසයක පැවතුණි.<br>උපකරණ කට්ටල බෙදාහැරීමේදී ප්‍රතිලාභීන් සමඟ එළඹෙන ලද ගිවිසුම්වල සඳහන් අත්සන්, ප්‍රතිලාභීන් විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් ලිපිවල සහ භාණ්ඩ භාරගැනීමේ ලේඛනවල සඳහන් අත්සන් සමග නොගැලපෙන අවස්ථා 40 ක් පැවතුණි.<br>වටිනාකම රු.96,000 ක් වූ මහන මැෂින් 02 ක් බෙදාහැරීම පිළිබඳ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවූ අතර 2021 වර්ෂයේ උපකරණ කට්ටල බෙදාදීමෙන් පසු ඒවා උපයෝගී කරගෙන ස්වයං රැකියාවල යෙදීම පිළිබඳව 2023 වර්ෂයේ සිදු කරන ලද සමාලෝචනය අනුව බෙදාදෙන ලද උපකරණ කට්ටල 180 න් 76 ක් සම්බන්ධව කිසිදු සමාලෝචනයක් සිදු කර නොතිබුණි. | කිරීම සඳහා එම පුහුණුව ලැබූ ළමයින්ගේ කැමැත්ත ප්‍රකාශ කර තිබුණද මේ සඳහා අනුමැතිය ලැබී උපකරණ මිලදී ගත් අවස්ථාව වන විට යම්කිසි කාලයක් ගත වූ බැවින් එය බෙදාදෙන අවස්ථාවේදී එම සිසුන් ඉදිරිපත් නොවීම නිසා ඒ හා සමාන පුහුණුව ලද ස්වයං රැකියා කරමින් පවතින පුද්ගලයින් සඳහා උපකරණ බෙදා දීමට සිදු වූ බව.<br>වතුකරයේ ජීවත්වන අඩු ආදායම්ලාභී ප්‍රජාව ලියකියවිලි සඳහා අත්සන යෙදීමේදී වඩා වැඩි සැලකිල්ලක් නොදක්වන අතර අත්සන් යෙදීමේදී යම් වෙනස්කමක් පැවතිය හැකි බව.<br>මෙම ඉතිරි මහන මැෂින් දෙක ලබාදී තිබෙන පුද්ගලයන්ගේ විස්තර හැකි ඉක්මනින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බවත් මෙම ප්‍රතිලාභීන් 76 දෙනා සම්බන්ධකර ගැනීමට නොහැකිව පැවතීම නිසා සමාලෝචනය කිරීමට නොහැකි වූ බව. | බෙදාහැරීම සිදුකල යුතුය. රජයේ අරමුදල් ඵලදායීව ප්‍රයෝජනයට ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු විය යුතුය. |

**3.4 මානව සම්පත් කළමනාකරණය**

| | | |
|---|---|---|
| නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) **තනතුර** සඳහා නිලධාරියෙකු 2020 වර්ෂයේදී බඳවා ගැනීමේදී අනුමත වූ බඳවාගැනීම් පරිපාටියක් නොමැති බැවින් අවශ්‍ය සුදුසුකම් සපුරාලන්නේද යන්න පරීක්ෂා කිරීමට විගණනයට නොහැකි වූ අතර පදනම විසින් 2023 වර්ෂයේදී අනුමැතියට ඉදිරිපත් කරන ලද බඳවාගැනීමේ පරිපාටිපාටියේ ඇතුලත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (සංවර්ධන) තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම්ද එම නිලධාරියා සම්පූර්ණ කර නොතිබුණි. | ගරු අමාත්‍යතුමාගේ නිර්දේශ මත සිදු කරන ලද පත්කිරීම් බැවින් නව කාර්යමණ්ඩල අනුමැතිය ලැබෙන තෙක් තාවකාලිකව ඉදිරියටත් තබා ගැනීම පදනමේ අරමුණ වී ඇති බව. | විධිමත් බඳවා ගැනීමේ පටිපාටියක් සකස් කර එය අනුමත කරවාගෙන බඳවා ගැනීම් සිදුකල යුතුය. |